**ශ්‍රී ලංකා පදනම - 2022**

**------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා පදනමේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, පදනම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය පදනම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා පදනමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

පදනමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, පදනමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් පදනමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ පදනමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ පදනමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, පදනම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතයට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 11, “හුවමාරු නොවන ගනුදෙනුවලින් වන අයහාරය” ප්‍රමිතයට අනුව (2019 ජුනි 19 දින රැස් වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත කමිටු රැස්වීමේදී තීරණය කල), භාණ්ඩාගාරයෙන් ලද රු.10,400,000 ක් වටිනා ප්‍රාග්ධන ප්‍රදාන ගිණුම්ගත කර නොතිබුණි. | මෙම ප්‍රාග්ධන ප්‍රදාන නව ගිණුම්කරණ ප්‍රමිතියට අනුව ඉදිරි වර්ෂයේදී ගිණුම් ගත කිරීමේට පියවර ගනු ලැබේ. | අදාල ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුය |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතනය විසින් දැනටමත් භාවිතා කරමින් පවතින මුළුතැන්ගෙය නවීකරණය සඳහා වැයකර ඇති රු.26,846,285 ක් වූ මුළුතැන්ගෙයි උපකරණ සහ අළුත්වැඩියා වියදම් අවශ්‍ය පරිදි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සහ අයභාර වියදම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීම වෙනුවට නොනිමි වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි. | මුළුතැන්ගෙයි නවීකරණ කටයුතු වැඩ කොන්ත්‍රාත්කරු විසින් මෙතෙක් අවසන් කර නිසි පරිදි භාර දී නැති අතර, නවීකරණ කටයුතු සඳහා මුළු වටිනාකම ගෙවා නිමකර නොමැති හෙයින් වැය වූ මුදල නොනිමි වැඩ ලෙස දක්වා ඇත. | අදාල පරිදි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ හා අයභාර වියදම් හඳුනාගෙන ගිණුම් ගත කල යුතුය |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්
### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) 2010 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ශ්‍රී ලංකා පදනම විසින් පවත්වා ඇති අධ්‍යාපනික වැඩසටහන් සහ වැඩමුළු සඳහා විවිධ ආයතන වලින් ලැබිය යුතු රු.8,796,974 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | හිග ආදායම් නොපමවා අයකර ගැනීමට කටයුතු කළ යුතුය |
| (ii) 2014 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ව්‍යාපාර සංවර්ධන අංශය විසින් බාහිර පාර්ශවයන්ට සපයන ලද සේවා වෙනුවෙන් අයවිය යුතු රු.3,869,711 ක් අයකර ගැනීමට කටයුතුකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | හිග ආදායම් නොපමවා අයකර ගැනීමට කටයුතු කළ යුතුය |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 15 වන වගන්තිය | 2017 සිට 2021 දක්වා පවත්වා අවසන් කර ඇති පාඨමාලා 30 අතරින් පාඨමාලා 16 ක් තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කර | අලුත් කිරීම අවුරුදු 2කට වරක් සිදු කරන නිසා ලියාපදිංචි කිරීමේ ගැටලුවක් පැවැතුණි. මෙම පාඨමාලාවල තොරතුරු TVEC දත්ත පද්ධතියට ඇතුලත් කර ඇති අතර | 1990 අංක 20 දරන තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන පනතේ 15 වන වගන්තිය අනුව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | නොතිබුණි. තවද 2022 වර්ෂයේ පවත්වාගෙන යනු ලැබූ පාඨමාලා 47 ක් ලියාපදිංචි කර නොතිබුණි. | ලියාපදිංචියට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී. | |
| (ii) 2021 නොවැම්බර් 16 දින නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ පස්වන පරිච්ඡේදයේ ඇමුනුම 01 | ආයතනය විසින් ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දී තිබුණද (KPI) ඒවා ඇගයීම් කර ඉන් ඉටුකරගත් ප්‍රමාණය කොපමණද යන්න (outcome) පරීක්ෂාකර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත්කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය අනුව කටයුතු කළ යුතුය. |
| (iii) අංක 2001/03-137 දරන කළමණාකරන මණ්ඩල තීරණය. | සෑම කථිකාචාර්යවරයෙකුම මාසිකව ප්‍රගති වාර්තා පවත්වා ගතයුතු වුවද 2022 ජනවාරි සිට අගෝස්තු දක්වා කාලපරිච්ඡේදයේදී එසේ මාසිකව ප්‍රගති වාර්තා පවත්වාගෙන නොතිබුණි. | ආයතනයේ සියළු සේවකයින් හට පොදු ඇගයීම් ක්‍රමවේදයක් සැකසෙමින් පවතී . | දැනට ස්ථිර සේවයේ සිටින සියලුම කථිකාචාර්යවරුන්ගෙන් උපරිම සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (iv) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන සඳහා නිකුත් කරනු ලබන උපදෙස් පත්‍රිකාව | 2022 වර්ෂයේ ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලා 66 ක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන්ගේ තොරතුරු නියමිත පරිදි වෙබ් අඩවිය වෙත ඇතුලත් කර නොතිබුණි. | අලුත් කිරීම අවුරුදු 2කට වරක් සිදු කරන නිසා ලියා පදිංචි කිරීමේ ගැටලුවක් පැවැතුණි. මෙම පාඨමාලාවල තොරතුරු TVEC දත්ත පද්ධතියට ඇතුලත් කර ඇති අතර ලියාපදිංචියට අවශ්‍ය කටයුතු සිදුවෙමින් පවතී. | තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි පුහුණු ආයතන සඳහා නිකුත් කරනු ලබන උපදෙස් පත්‍රිකාව අනුව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.53,397,480 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.24,437,646 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.28,959,834 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ පාඨමාලා ගාස්තු ආදායම රු.38,788,158

කින් වැඩි වීම සහ, ආහාර සහ අනෙකුත් පහසුකම් සැපයීමේ ආදායම රු.18,739,499 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ශ්‍රී ලංකා පදනම විසින් උසස් ජාතික ඩිප්ලෝමා, ජාතික ඩිප්ලෝමා, සහතික පත්‍ර පාඨමාලා සහ විවිධ වැඩමුළු 103 ක් සමාලෝචිත වර්ෂයේදී පවත්වා ස්ථිර කථිකාචාර්යවරු 10 ක් සඳහා දේශක ගාස්තු වශයෙන් රු.15,633,473 ක් සහ බාහිර කථිකාචාර්යවරු සඳහා රු.17,078,356 ක් ගෙවා තිබුණි. නියැදි පරීක්ෂාවකදී පාඨමාලා සහ වැඩමුළු 45 කින් 29 ක් සඳහා බාහිර කථිකාචාර්යවරු පමණක් සේවයේ යොදවා තිබූ අතර පාඨමාලා 06 කදී බාහිර කථිකාචාර්යවරුන්ගේ සම්පත් දායකත්වය සියයට 75 ඉක්මවා ගොස් තිබුණි. ආයතනයේ පාඨමාලා සම්බන්ධීකරණ ඒකකයක් පැවතියදී පදනමේ ස්ථිර කථිකාචාර්යවරු මෙම පාඨමාලාවල සම්බන්ධීකරණ කටයුතු පමණක් සිදුකර තිබුණි. | කථිකාචාර්යවරු ආයතනයේ මූල්‍ය තත්ත්වය හා ඔවුන්ගේ වාර්ෂික ඉලක්ක සැලකිල්ලට ගෙන සිය විෂය පථයෙන් බැහැර වැඩසටහන් සංවිධානය කරති. එහිදී එම විෂය පිළිබඳ දැනුම නොමැති නිසා ගුණාත්මකභාවයෙන් යුක්ත දේශන කිරීමේ හැකියාවක් ඔවුනට නැත. එබැවින් බාහිර සම්පත්දායකයින් බඳවා ගෙන ඇත. | දැනට ස්ථිර තනතුරුවල නිරත වන කථිකාචාර්යවරුන් ගෙන් උපරිම සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2022 වර්ෂයේ පවත්වා තිබූ පාඨමාලා තුනකින් ලැබී ඇති සත්‍ය ආදායම රු. 681,600 ක් වූ අතර ඇස්තමේන්තුගත ස්ථාවර පිරිවැය රු.3,037,000 ක් විය. ඒ අනුව දේශක ගාස්තු, දේශනශාලා පිරිවැය සහ වෙනත් පොදුකාර්යය පිරිවැය යන ස්ථාවර ස්වරූපයේ පිරිවැය වෙනස් නොවන බැවින් ස්ථාවර පිරිවැයේ වටිනාකම පමණක් හෝ පාඨමාලා ගාස්තු මඟින් ආවරණය කර ගත නොහැකි වීමෙන් ආයතනය සිදුවූ අලාභය රු.2,355,400 ක් විය. | පිළිතුරු ලබා දී නොමැත | පිරිවැය සහ ප්‍රතිලාභ ඇගයීමට ලක්කර පාඨමාලා ආරම්භ කළ යුතුය. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලංකා බැංකුවේ ජංගම ගිණුමේ 2022 දෙසැම්බර් 31 වන දිනට රු.54,780,779 ශේෂයක් පවත්වාගෙන ගොස් තිබුණි. මෙම මුදල කෙටිකාලිනව ඵලදායී ආයෝජනයක යොදවා ආයතනයට ප්‍රතිලාභයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 ඔක්තෝම්බර්හිදී පාලක මණ්ඩලයේ අනුමැතිය මත වර්ෂ අවසානයේ ගෙවීමට ඇති අතැති මුදල් කෙටි කාලීන ආයෝජන මාර්ග (රාජ්‍ය බැංකු ස්ථාවර තැන්පතු) වල යොදවන ලදී. | අතිරික්ත අරමුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 වගන්තිය පරිදි 2022 ජනවාරි 10 දින, අංක 128 දරන පියෝ ටීවී (PEO TV) නාලිකාව, චිත්‍රාගාරය ,පාලන මැදිරිය ,නිෂ්පාදන උපකරණ සහ අදාළ සේවාවන් වර්ෂ 5ක කාලයක් සඳහා බදු පදනම මත පවරා දීමේ ටෙන්ඩර් කාර්යය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර තිබුණද තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණු අතර 2022 ජනවාරි 07 දිනැති අංක SLF/01/20/12 දරන වැඩබලන අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මඟින් අදාල ආයතනය වෙත 2022 ජනවාරි 10 දින සිට බලපැවැත්වෙන පරිදි ටෙන්ඩරය පිරිනමා තිබුණි. | කටයුතු ඉතා ඉක්මනින් ආරම්භ කිරීමේ අවශ්‍යතාවයක් මත 2022 ජනවාරි 7 දිනැති අංක SLF/01/20/12 දරන වැඩ බලන අධ්‍යක්ෂක ජෙනරාල්වරයාගේ ලිපිය නිකුත් කර එහි කාර්යයන් ආරම්භ කරන ලෙස දැනුම් දී ඇත. ආවරණය සඳහා පමණක් 2022-01-12 වන දින කළමණාකරන පත්‍රිකා අංක 178 යටතේ ටෙන්ඩරය පිරිනැමූ බවට තවදුරටත් ආවරණ අනුමැතිය තහවුරු කර ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 වගන්තිය පරිදි කටයුතු කළ යුතුය. |
| (ii) අංක 128දරන පියෝ ටීවී (PEO TV) නාලිකාව බදු පදනම මත පවරා දීම සම්බන්ධ ලංසු කැඳවීමේ ලිපිගොනුවේ සඳහන් ගිවිසුමේ පොදු කොන්දේසි අංක 3.1 පරිදි බදුකරු විසින් බදු ගිවිසුම පිරිනැමීමේ නිවේදනය ලැබීමෙන් දින හතක් (7) ඇතුලත බැංකු ඇපකරයක් මඟින් කාර්යය සාධන බැඳුම්කරයක් (Performance Bond), ලබා දිය යුතු බව සඳහන් වුවද, අදාල පරිදි බදුකරුගෙන් කාර්යය සාධන බැඳුම්කරයක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2021 දෙසැම්බර් මස 24 දිනැති Nations Trust බැංකුව මගින් නිකුත් කරන ලද 052D8062110357 දරන රු.120,000.00 ක් වටිනා කාර්යසාධන බැඳුම්කරය (Performance Bond) අදාළ ආයතනය විසින් ඉදිරිපත් කර ඇත. | ලංසු කැඳවීමේ ලිපිගොනුවේ සඳහන් පරිදි අදාල වටිනාකමින් යුත් බැංකු ඇපකරයක් මඟින් කාර්යසාධන බැඳුම්කරයක් ලබාගත යුතුය. |

| | | |
|---|---|---|
| (iii) සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා මාස 4 ක බදු කුලිය ලෙස රු.4,050,685 ක් සහ ආහාර සහ නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා මාස 7 ක් සඳහා පුද්ගලික සමාගමකින් රු. 300,189 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (i) ශ්‍රී ලංකා පදනමේ අධ්‍යක්ෂ ජෙනරාල් හා මහජන සම්බන්ධතා නිලධාරි යන තනතුරු දෙක 2021 සැප්තැම්බර් සිට 2022 දෙසැම්බර් දක්වා මාස 16 ක් පුරප්පාඩු වී තිබුණි. නිළධාරීන් දෙදෙනෙකු තම නිත්‍ය තනතුරේ රාජකාරි වැඩ වලට අමතරව එම තනතුරු දෙක සඳහා වැඩ බලන නිළධාරීන් ලෙස කටයුතු කර එම කාලය සඳහා රු.540,847 ක දීමනාවක් ලබාගෙන තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 13.3 පරිදි වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරනතෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍යනම් නිත්‍ය පත්කිරීම නොපමවා කළ යුතුය. |
| (ii) පුරප්පාඩු වූ කළමණාකරන සහකාර තනතුරු 10 ක් සඳහා ස්ථිර පදනමට සුදුසු කම් ලත් නිලධාරින් බඳවා නොගෙන, 2021 වර්ෂයේදී හා 2022 වර්ෂයේදී පුරප්පාඩු වූ එම තනතුරු 7 ක් සඳහා තාවකාලික පදනමට බඳවා ගත් සේවකයින් දෙදෙනෙකුට 2021 වර්ෂයේ රු.68,410 ක් ද 2022 වර්ෂයේ 7 දෙනෙකු සඳහා රු.2,191,029 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි. | පිළිතුරු ලබා දී නොමැත | ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 13.3 පරිදි වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණි. පූර්ණ කාලීන නිලධාරියෙකුගේ සේවය අවශ්‍යනම් නිත්‍ය පත්කිරීම නොපමවා කළ යුතුය. |